තලාව ප්‍රාදේශීය සභාව

අනුරාධපුර දිස්ත්‍රික්කය

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2011 මැයි 26 දිනද ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2010 මැයි 18 දිනද විගණනයට ඉදිරිපත් කර තිබුණි.

### 1.2 මතය

මෙම වාර්තාවේ දක්වා ඇති අදහස් දැක්වීම් සහ නිරීක්ෂණයන් හේතු කොට ගෙන විගණනය සඳහා ඉදිරිපත් කර ඇති තලාව ප්‍රාදේශීය සභාවේ 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට මට නොහැකිය.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම.

#### 1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

මූල්‍ය ප්‍රකාශනවල පැවති ගිණුම්කරණ අඩුපාඩු හා එමගින් මූල්‍ය ප්‍රකාශනවලට සිදු වී ඇති බලපෑම පිළිබඳ සාරාංශයක් පහත දැක්වේ.

| | අඩුපාඩුවේ ස්වභාවය | විෂයයන් ගණන | මූල්‍ය ප්‍රකාශනවලට බලපෑම | | |
|---|---|---|---|---|---|
| | | | ආදායම් | වියදම් | වත්කම් |
| | | | රු.'000 | රු. '000 | රු.'000 |
| (අ) | මූල්‍ය ප්‍රකාශනවල වැඩියෙන් දැක්වීම් | 02 | - | - | 2,704 |
| | - එම - | 01 | 243 | - | - |
| (ආ) | මූල්‍ය ප්‍රකාශනවල අඩුවෙන් දැක්වීම් | 01 | 67 | - | - |

| | | | | | |
|---|---|---|---|---|---|
| | - එම - | 03 | - | - | 361 |
| (ඈ). | මූල්‍ය ප්‍රකාශනවලින් අත්හැරීම් | 06 | - | - | 333 |
| | - එම - | 01 | - | 1,252 | - |
| (ඇ) | මූල්‍ය ප්‍රකාශනවල අනුචිත හෙළිදරව් කිරීම් | 04 | - | - | 905 |

### 1.3.2 නොසැසඳු ගිණුම්

මූල්‍ය ප්‍රකාශන අනුව ගිණුම් විෂයයකට අදාල ශේෂය රු. 1,078,098 ක් වු අතර, උපයෝගලේඛන/වාර්තා අනුව එම ශේෂය රු. 1,178,608 ක් විය.

### 1.3.3 පැහැදිලි නොකළ වෙනස්කම්

2010 දෙසැම්බර් 31 දිනට ගිණුම් විෂයයන් 2 ක ප්‍රධාන ලෙජරය අනුව ශේෂ එකතුව රු: 88,694,325 ක් වූ අතර ශේෂ පිරික්සුම අනුව එම ශේෂ එකතුව රු: 74,020,879 ක් වූයෙන් රු: 14,673,446 ක වෙනසට හේතු පැහැදිලි නොකෙරිණි.

### 1.3.4 විගණනය සඳහා සාක්ෂි නොවීම

අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු.4,554,687 ක් වු ගිණුම් විෂයයන් 07 ක් විගණනයේදි සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය/සතොයක්ෂණය කිරීමට නොහැකි විය.

### 1.3.5 අනුකූල නොවීම්

පහත දැක්වෙන නීති,රීති රෙගුලාසි හා කළමණාකරණ තීරණ වලට අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| | නීති,රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) | 2006 අංක 10 දරන දේශීය ආදායම් පනතේ 153 හා 154 වගන්ති | සෑම ආයතනයක්ම මාසිකව රු.50,000 වැඩි සේවා සැපයුම් හෝ ඉදිකිරීමකදී නිශ්චිත ගාස්තු මත රඳවා ගැනුම් බදු 5% අය කර දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් වෙත යැවිය යුතු වුවත් සමාලෝචිත වර්ෂයේදී රඳවා ගැනුම් බදු අය කර නොතිබුණි. |

| | | |
|---|---|---|
| (ආ). | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාස 570,571 | කල් ඉකුත් වූ තැන්පතු ආදායමට ගත යුතු වුවත් රුැ.12,241,626 ක ඉකුත් තැන්පත් ආදායමට ගෙන නොතිබුණි. |

(ඇ). උතුරු මැද පළාත් මුදල් රෙගුලාසි සංග්‍රහය

| | | |
|---|---|---|
| (i). | පළාත් මූල්‍ය රීති 261.2-2 | වරකට තත්කාර්ය අතුරු අග්‍රිම ලබාගත හැකි උපරම සීමාව රුැ.100,000 ක් වුවත් අවස්ථා 05 කදී රුැ.950,000 ක අත්තිකාරම් නිකුත් කර තිබුණි. |
| (ii). | 546,553 | සභාවේ ලේකම් හා මුදල් භාරකරුගෙන් ඇප ලබාගෙන නොතිබුණි. |

## 2. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵලය

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රුැ.12,378,962 ක් වු අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රුැ.8,144,179 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2..2.1 ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්

සභාපතිවරයා විසින් සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබුණු ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | | 2010 | | | 2009 | | |
|---|---|---|---|---|---|---|---|
| | ආදායම් විෂයය | ඇස්තමේන්තු ගත | තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය | ඇස්තමේන්තු ගත | තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
| | | රුැ.'000 | රුැ.'000 | රුැ.'000 | රුැ.'000 | රුැ.'000 | රුැ.'000 |
| (අ) | වරිපනම් හා බදු | 2,531 | 1,211 | 1,320 | 3,000 | 2,555 | 5,327 |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| (ආ) | බදු කුලී | 3,765 | 3,757 | 08 | 7,100 | 7,080 | 2,146 |
| (ඇ) | බලපත්‍ර ගාස්තු | 1,045 | 605 | 440 | 3,700 | 3,660 | 120 |
| (ඇ) | වෙනත් ආදායම් | 9,267 | 619 | 8,648 | 26,200 | 25,825 | 8,594 |

### 2.2.2 උසාවි දඩ මුදල්

විවිධ ආඥා පනත් යටතේ මහෙස්ත්‍රාත් අධිකරණයක් විසින් 2010 දෙසැම්බර් 31 දක්වා අයකර ප්‍රධාන ලේකම් වෙත එවා ඇති රු. 6,878,794 ක දඩ මුදල් සභාවට ලැබිය යුතුව තිබුණි.

### 2.2.3 ආදායම් අයකර ගැනීමේ දුර්වලතා

1987 අංක 15 දරණ ප්‍රාදේශිය සභා පනතේ 152 සහ 153 වගන්ති ප්‍රකාර ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ පෞද්ගලික උපකාරක පන්ති හා නීතිඥ සේවා ආයතන වලින් සහ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පිහිටි සංවර්ධනය නොකළ ඉඩම්වල ප්‍රාග්ධන බිම් අගයෙන් බදු අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

### 2.3 වියදම් ව්‍යුහය

සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂය සඳහා සභාවේ අයවැයගත හා තථ්‍ය වියදම අදාල විචලනයන්ද සමග පහත දැක්වේ.

| | 2010 | | | 2009 | | |
|---|---|---|---|---|---|---|
| වියදම් විෂයය | අයවැයගත | තථ්‍ය | විචලනය | අයවැයගත | තථ්‍ය | විචලනය |
| පුනරාවර්ථන වියදම් | රු.'000 | රු.'000 | රු.'000 | රු.'000 | රු.'000 | රු.'000 |
| පෞද්ගලික පඩිනඩි | 24,011 | 18,482 | 5,529 | 18,000 | 17,209 | 791 |
| අනෙකුත් | 9,976 | 10,329 | (353) | 13,800 | 13,767 | 33 |
| උප එකතුව | 33,987 | 28,811 | 5,176 | 31,800 | 30,976 | 824 |
| ප්‍රාග්ධන වියදම | 9,360 | 19,742 | (10,382) | 65,000 | 68,528 | (3,528) |
| මුළු එකතුව | 43,347 | 48,553 | (5,206) | 96,800 | 99,504 | (2,704) |

## 2.4 මානව සම්පත් කළමනාකරණය

අනුමත හා තථ්‍ය සේවක සංඛ්‍යාව

2010 දෙසැම්බර් 31 දිනට සභාවේ අනුමත හා තථ්‍ය සේවක සංඛ්‍යාව පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | සේවක ශ්‍රේණිය | අනුමත | තථ්‍ය |
|---|---|---|---|
| (අ) | මාණ්ඩලික | 01 | 01 |
| (ආ) | ද්විතීය | 08 | 07 |
| (ඇ) | ප්‍රාථමික | 39 | 33 |
| | එකතුව | 48 | 41 |

## 2.5 වත්කම් කළමනාකරණය

### 2.5.1 නිෂ්ක්‍රීය භෞතික සම්පත්

උතුරු මැද පළාත් ප්‍රධාන අමාත්‍යාංශය විසින් සහල් පිටි ආශ්‍රිත බේකරි නිෂ්පාදන ව්‍යාපෘතියක් ආරම්භ කිරීම සඳහා 2008 වර්ෂයේදී රු.814,000 ක උපකරණ සභාවට ලබාදී තිබුණ නමුත් 2011 ජූලි 04 විගණිත දිනය වන විටත් ව්‍යාපෘතිය ආරම්භ කර නොතිබීම නිසා එම උපකරණ නිෂ්කාර්යව පැවතුණි.

### 2.5.2 අයවීමට ඇති සේවක ණය

2010 දෙසැම්බර් 31 දිනට අයවිය යුතුව තිබූ සේවක ණය අත්තිකාරම් ශේෂවල එකතුව රු.6,419,630 ක්වූ අතර අවුරුදු 01 කාලයක් ඉක්මවා අයවීම් හිඟහිටි ගිණුම් ශේෂවල එකතුව රු.114,609 ක් විය.

### 2.5.3 අචල ජංගම වත්කම්

2010 දෙසැම්බර් 31 දිනට අවුරුදු 01 කාලයක් ඉක්මවා අචලව පවතින වත්කම්වල අගය රු.45,550 ක් විය.

-----------------------------------------------------------------------------------------------------------------------------------------

### 2.5.4 සමීක්ෂණය නොකළ වත්කම්

--------------------------------

සමීක්ෂණ මණ්ඩල වාර්තා මගින් තහවුරු නොවූ 2010 දෙසැම්බර් 31 දිනට පොත් අගය මත ගණන් බැලූ වත්කම්වල වටිනාකම රු.76,409,832 ක් විය.

### 2.6 ප්‍රමාණවත් අධිකාර් බලයකින් තහවුරු නොවූ ගනුදෙනු

------------------------------------------------------------

ආයතන සංග්‍රහයේ xv පරිච්ඡේදයේ 2.1 ඡේදය ප්‍රකාරව විදේශ අධ්‍යාපන වැඩ සටහන්, අමාත්‍යාංශ ලේකම්ගේ සමායෝජනය යටතේ සිදුවිය යුතු වුවද අමාත්‍යාංශය යටතේ සමායෝජනය නොවූ විදේශ අධ්‍යයන වැඩ සටහනකට සහභාගිවීම සඳහා සභාපතිවරයාට 2010 සැප්තැම්බර් 06 දින අංක1353 දරන වවුචරය මගින් රු.150,000 ක් ගෙවා තිබුණි. සියළු අමාත්‍යාංශ ලේකම්වරු ඇමතූ 2006 පෙබරවාරි 11 දිනැති අංක පීඑස්ඒ /1/1/2006 දරන ජනාධිපති ලේකම්ගේ චක්‍රලේඛය ප්‍රකාරව එම සංචාරය රජයට හෝ ප්‍රාදේශීය සභාවට ප්‍රතිලාභ අත්වන සංචාරයක් බවට තහවුරු නොවීය.

### 2.7 අවිධිමත් ගණුදෙණු

-------------------

(i) උතුරු මැද පළාත් ප්‍රධාන ලේකම්ගේ 2003 සැප්තැම්බර් 17 දිනැත අංක දරණ එන්සීපී/සීඑස්/පීටී/04 පළාත් භාණ්ඩාගාර චක්‍රලේඛ අනුව මහනැගුම හා ගම නැගුම ව්‍යාපෘතිවල පර්පාලන වියදම් සඳහා වෙන් කළ ප්‍රතිපාදන වලින් ගෙවීම් කළ හැක්කේ අතිකාල ගමන් වියදම්, දින වැටුප් පමණක් වුවද ඊට පටහැනිව 2010 මාර්තු 10 දින වවුචර් අංකය 319 හා 320 මගින් රු123,575 ක් සභාපති ඇතුළු කාර්ය මණ්ඩලය වෙත ගෙවා තිබුණි.

(ii) සභාව සතුව රු.13,950,000 ක් වටිනා මෝටර් ග්‍රේඩරයක් හා රු.4,473,500 ක් වටිනා ටිපර් යන්ත්‍ර 02 ක් තිබියදී පිටතින් කුලී පදනම මත සභාවේ අනුමැතියකින් තොරව, පිලිගත් ටෙන්ඩර් පර්පාටියෙන් බැහැරව විධිමත් ගිවිසුමක් නොමැතිව යන්ත්‍ර සේවා ලබා ගැනීම සඳහා පෞද්ගලික සමාගමක් වෙත 2010 මාර්තු හා අප්‍රේල් මාසවල වවුචර් අංක 375 හා 556 මගින් රු.350,000 ක අත්තිකාරම් ගෙවා තිබුණි. එනමුත් 2010 දෙසැම්බර් 31 දක්වාද අදාල කාර්ය නිම කළ බව සනාථ වෙන බිල්පත් ඉදිර්පත් නොවුණි.

### 2.8 කාර්ය සාධනය

------------------

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 03 වන වගන්තිය ප්‍රකාර ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ජනතාවගේ පහසුව, සුභසාධනයට අදාල කාර්යයන් හා සෞඛ්‍ය, මංමාවත් හා පොදු උපයෝගි

සේවාවන්ට අදාල කාර්යයන් ඉටු කිරිම සඳහා ඉදිරි වර්ෂවල ක්‍රියාකාරීත්වයට අදාල සැලසුම් ඇතුළත් සංයුක්ත සැලැස්මක් සකස් කර නොතිබුණි.

**2.9 කොන්ත්‍රාත් පරිපාලනය**

**ඉදිකිරීම්**

(අ). සමාලෝචිත වර්ෂය තුළ කර්මාන්ත 06 ක් සඳහා පළාත් ඉංජිනේරුවරයාගේ තත්ව පාලන වාර්තා ලබා ගැනීමෙන් තොරව රු.1,561,999 ක් ගෙවා තිබුණි.

(ආ). සභාව විසින් එප්පාවල පොස්පේට් මාර්ගයේ ගල් අතුරා තාර දැමීමේ ව්‍යාපෘතියක් සිදු කරනු ලැබ තිබු අතර ඒ වෙනුවෙන් 2010 අප්‍රේල් 07 දිනැති අංක 438 දරන වවුචරය මගින් රු.275,360 ක් කොන්ත්‍රාත්කරුට ගෙවා තිබුණි. ඇස්තමේන්තුව හෝ වැඩ අවසන් වාර්තාව හා වැඩබිම් සැපයුම් පිළිබඳ වාර්තාවක් විගණනයට ඉදිරිපත් නොකෙරිණි.

**2.10 අභ්‍යන්තර විගණනය**

ආයතනය තුළ ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදු කර නොතිබුණි.

**3. පද්ධති හා පාලන**

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කෙරේ.

(අ) ගිණුම්කරණය.

(ආ) ආදායම් පරිපාලනය.

(ඇ) වත්කම් කළමනාකරණය.

(ඈ). කොන්ත්‍රාත් පාලනය.

(ඉ) ණයගැති හා ණයහිමි පාලනය.